# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනය:- 2001-12-14 වන දින පස්වරු 3.00 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

| | | |
|---|---|---|
| 1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල් | | |
| 2. බී ඩී පී එස් විද්‍යාරත්න | මහත්මිය | අධ්‍යක්ෂ |
| 3. ආචාර්ය ගාමිණී ද සිල්වා | මහතා | අධ්‍යක්ෂ |
| 4. එස් මුදුරප්පෙරුම | මහතා | අධ්‍යක්ෂ |
| 5. ඒ එම් යූ දිසානායක | මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 6. ඒ ජේ සතරසිංහ | මහතා | ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ |
| 7. ජේ දොඩම්ගොඩ | මහතා | ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ |
| 8. ඩී ඩී එම් වී පෙරේරා | මෙය | ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ |
| 9. සී ඩී ද සිල්වා | මිය | ජ්‍යේ. සංඛ්‍යාලේඛනඥ |

සංගණන අධිකාරි හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ජාව ආරම්භ විය.

02. මෙදින පැවැති රැස්වීමේදී දත්ත භාවිතා කරන්නන් ලිඛිතව ඉදිරිපත් කොට තිබුන අදහස් පිළිබඳව සලකා බලා යට දැක්වෙන සංශෝධනයන් සහ එකතු කිරීම් සිදු කරන ලදි .

- 2.4 හි අධ්‍යාපන සුදුසුකම් යටතේ කේතාංක 6 ඉදිරියෙන් 'උසස් අධ්‍යාපන සුදුසුකම් යන්න වෙනුවට 'උපාධිය සමත්' යනුවෙන් යෙදීම

- කෘෂි ලිං යටතේ වගා කොට ඇති බිම් පිළිබඳව ප්‍රශ්නයක් සකස් කොට ඇතුළත් කිරීම [illegible]

- 5.2.7 හි *මල්/විසිතුරු පැල බිම් ප්‍රමාණය'* වෙනුවට *'මල්/විසිතුරු පැල වෙළඳාම සඳහා මෙම ගොවි කාණ්ඩයේ වගා කරනු ලැබේ ද'* යන ප්‍රශ්නය ඇතුළත් කිරීම

- වී වගාවේ අත්හැර දමා ඇති බිම් ප්‍රමානය විමසීම සඳහා යෝජනා වී ඇති අදහස ප්‍රතික්ෂේප විය. දැනටමත් පී 1 ලේඛන යටතේ සීමිත තොරතුරක් එක් රැස්කෙරේ.

- සත්ත්ව පාලනය පිළිබඳව විමසන ලද 8 වන කොටසේ 8.1 (C) හි 'අවු 1ට වැඩි පැටවකු නොලද' යන්න 'අවු 2 ට අඩු පැටවකු නොලද' යනුවෙන් සංශෝධනය කිරීම සහ මෙම කොටස සඳහා යෝජනා කොට ඇති අනෙකුත් වෙනස්කම් පශු සම්පත් හා සත්ත්ව සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් හා වැඩිදුර සාකච්ජා කොට තීරණයකට එළඹීම
- 5.2 හි වූ 'වෙනත් කාලීන භෝග' යටතේ 5.2.7 'මාංශ භෝග' 5.2.8 'රට භෝග' 5.2.9 'තෙල් භෝග' 5.2.10 *අල භෝග* යන භෝග වර්ගයන් ඇතුළත් කිරීම

- 6 වන කොටසේ ඇතුලත් යන්ත්‍රෝප කරන ලැයිස්තුවේ 6.3 හි සඳහන් 'දියර හෝ කුඩු ඉසින යන්ත්‍ර' වෙනුවට 6.3.1 'අතින් ක්‍රියා කරන දියර ඉසින' හා 6.3.2 'බල ඉසින යන්ත්‍ර' ලෙසත් 6.4 හි සඳහන් 'ධාන්‍ය වෙන් කරන යන්ත්‍ර' යන්න වෙනුවට 6.4.1 හි *'අතින් ක්‍රියා කරන කොළ මඩින යන්ත්‍ර'* යන්නනත් 6.4.2 හි *'බල කොළ මඩින යන්ත්‍ර'* යන්නනත් ලෙස ඇතුළත් කිරීම

- වතු අංශයේ සංගණන කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන වතු ලැයිස්තුවක් පිළියෙල කිරීම සඳහා පසුගිය ජන සංගණනය සඳහා පිළියෙල කොට ඇති ලැයිස්තුව අනුව යමින් එම තොරතුරුද ඇතුළත් පූර්ණ වතු ලැයිස්තුවක් සකස් කිරීම සඳහා වූ කෙටුම්පතක්ද කෘෂිකර්ම සංගණන වතු උපලේඛනය සඳහා වූ කෙටුම්පතක් ද කමිටුව වෙත ඉදිරිපත් කෙරින. වතු ලැයිස්තුවේ 4 වන තීරුවේ මුලින්ම සඳහන් වන

'උපකොටස්' යන්නට ඉදිරියෙන් වත්ත හෝ උපකොටස්' යනුවෙන් සංශෝධනය විය යුතු බැව් පෙන්වා දෙනු ලැබීය.

- වතු ලැයිස්තුව සම්පූර්ණ කරවා ගැණීමේ කටයුතු සඳහා කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන නිලධාරීන්ට කිසියම් දීමනාවක් ගෙවීමටත් එම කටයුතු 2002 ජනවාරි - පෙබරවාරි මාස තුළ දී ඉටු කරගැනීමටත් අදහස් කරන බව ප්‍රකාශ විය.

- ගොවි කාණ්ඩ කිසිවකුත් මග නොහැරෙන පරිදි හඳුනා ගැනීම වඩාත් වැදගත් බව අවධාරනය කෙරෙන පරිදි සකසන ලද දෙබසක් ගණන් ගණ්නා නිලධාරියාගේ අත්පොතට අඩංගු කිරීමටත් එහිදි එම දෙබසේ අඩංගු ඇතම් වචන වෙනස් කොට එහි අන්තර්ගතයම ඇතුළත් කිරීමට තීරණය විය.

- නියමු සංගණනයේ ලැබී ඇති දිස්ත්‍රික් වාර්තා ඇසුරෙන් ද සංශෝධනයන් කිහිපයක් සිදු කිරීමට තීරනය විය. මෙහි දී නියමු සංගණනයේ වැදගත් කමත් එහි නිරත වන්නන් ඇතුළු ක්ෂේත්‍ර කාර්‍ය මණ්ඩලවල අදහස් සහ යෝජනා ලබා ගැනීමේ වැදගත් කමත් සැළකිල්ලට ගත යුතු බැව් අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ප්‍රකාශ කරන ලදි.

- කෘ සං 1 උපලේඛනයේ 9 වන තීරුව වඩාත් සරල යෙදුමකින් විස්තර වනසේ ' 7 හා 8 තීරු දෙකෙහිම 1 කව නොකළේ නම්' යන්න වෙනුවට ' 7 හා 8 තීරු දෙකෙන් එකකට හෝ 2 කව කළේ නම්' යන්න ඇතුළත් කිරීම

- කෘ සං 1 උපලේඛනයේ 5 හා 6 වන තීරු දෙක අතරින් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය පිළිබඳව විස්තර ඇතුළත් කිරීම සඳහා අවකාශයක් සැපයීමට නොහැකි බව පෙන්වා දෙන ලදි.

- කෘ සං 2 ප්‍රශ්න මාලාවේ 1 වන කොටසේ 1.4 ග්‍රා.නි.කො. අංකය සඳහා යොදා ඇති කොටු දෙක වෙනුවට කොටු තුනක් යෙදීම

- ගණන් ගණ්නා නිලධාරියාගේ අත්පොතෙහි සඳහන් ගෙවත්ත යන්නෙහි අර්ථ දැක්වීම වඩාත් පැහැදිලි අයුරින් නැවත ඉදිරිපත් කිරීමටත් උදාහරන මගින් පැහැදිලි කිරීමේ අවශ්‍යතාවයත් පෙන්වා දෙන ලදි.

- දත්ත සැකසුම් අංශය ද කෘෂිකර්ම සංගණනය පිළිබඳව දැණුවත් කොට සහභාගි කරවා ගෙන නියමු සංගණන ප්‍රශ්නමාලා ඇසුරෙන් පරිගනක වැඩ සටහන් සැකසීමේ අවශ්‍යතාවයද මෙහිදි සාකච්ඡා විය. දත්ත සැකසීමේ කාර්‍යය කඩිනමින් හා පහසුවෙන් ඉටු කළහැකි වෙනත් විකල්ප ක්‍රියා මාර්ග පිළිබඳවද දීර්ග ලෙස සාකච්ඡා කරන ලද නමුත් නිශ්චිත තීරනයක් ගැනිමට පහසු වනු වස් නියමු සංගණන තොරුතුරු 'ස්කෑනර්' යන්ත්‍ර (scanner) ප්‍රයෝජනයට ගෙන ඉටුකර ගතහැකිදැයි සාකච්ඡා විය.

- ජන සංගණනයේ දී සංගණන කාණ්ඩ මට්ටමින් පිළියෙළ කොට ඇති පූර්ව ලැයිස්තු ගත කිරීමේ ලේඛනයන් ඡායා පිටපත් ගැනීම පිළිබඳවද සාකච්ඡා විය. ඒ සඳහා අවම වශයෙන් ඡයා පිටපත් ලක්ෂ 8 ක් වත් වැය වෙතැයි ද මෙම කටයුත්ත කරගත හැකි විකල්ප මාර්ග ගැනද සලකා බලන ලෙස අධ්‍යක්ෂ ජනරාල් වරයා දන්වන ලදි. තවද මෙම කටයුත්තද 2002 පෙබරවාරි මාසයේ දී වත් ආරම්භ කලයුතු බැව් දන්වන ලදි.

පස්වරු 4. 30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

ජේ. දොඩම්ගොඩ 12/20
සංඛ්‍යාලේඛනඥ